**රිදීගම ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රිදීගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

- හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.90,936 ක් වූ පරිගණක යන්ත්‍රයක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | භෞතික සැලසුම් වැඩසටහන යටතේ සේවා සඳහා ගාස්තු ආදායම රු.2,614,112 ක් වුවත් එය රු. 2,678,239ක් ලෙස රු.64,127 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2020 වර්ෂයේ සපිරිගමක් වැඩසටහන යටතේ කරන ලද සංවර්ධන ව්‍යාපෘති 171 ක් සඳහා ගෙවිය යුතු වටිනාකම රු.11,986,131 ක් වුවත් එය රු.15,491,998 ක් ලෙස රු.3,741,935 කින් ණය හිමියෝ වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. එලෙස ණයහිමියන් ගිණුම්ගත කිරීම නිසා ඊට අදාළ ණයගැතියන්ද රු. 3,741,935 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ සපිරිගමක් සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධන ව්‍යාපෘති 171 ක් සඳහා වන මුදල් ණයහිමි හා ණයගැති ලේඛනය වෙත ලබා දීමේදී එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු මුදල ලබා දී ඇති අතර, ගෙවීම් වාර්තා සකස් කිරීමේදී එම මුදල වෙනස් වී ඇත. මේ හේතුවෙන් ණයහිමි සහ ණයගැති වැඩියෙන් සඳහන් වී ඇති අතර මෙම වෙනස තීරණ කමිටුවට යොමු කර තීරණයක් ගැනීමෙන් අනතුරුව ලේඛන වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පිටියේගෙදර අතුරු මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු.170,990 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණද එය නැවත ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | ණයහිමි ලෙස වැරදීමකින් නැවත ගිණුම්ගත වී ඇති බව. | -එම- |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.65,082,022 ක් වූ ගිණුම් විෂයන් 08 කට අදාල ශේෂයන් හා උප ලේඛනයේ දැක්වෙන ශේෂයන් අතර රු.821,194 ක වෙනසක් විය. | නිවැරදි උපලේඛන සකස් කර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ හා උපලේඛනවල දැක්වෙන ශේෂ සමාන අගයක් ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 | හිඟ වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් ගෙවීම් පැහැරහරින පුද්ගලයින් සම්බන්ධයෙන් රීති 33 ප්‍රකාරව කටයුතු කරන බව. | යථෝක්ත රීතිය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 ජනවාරි 10 දිනැති අංක 2019/02 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | රිදීගම රෝහල අසල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු දීමේදී එකවර ගෙවීමේ මුදල් (Key money) ලබා ගත යුතු වුවද මෙම එකවර ගෙවන මුදල වර්ෂ 04 කින් ගෙවීමට සහන කාලයක් ලබා දීම හේතුවෙන් 2017, 2018, 2019, 2020 යන වර්ෂවල ගිවිසුම් අත්සන් කළද 2022 නොවැම්බර් 18 දින වන විට කඩ කාමර 07 කින් රු.3,863,000 ක් අයකර ගෙන නොතිබුණි. | කඩකාමර වලින් කඩකාමර 07 කට අදාළව අයකර ගත යුතු රු.3,863,000 මුදලින් මේ වන විට 735,000 මුදලක් ගෙවා ඇති බවත් ඉතිරි රු.3,128,000 ක මුදල තවදුරටත් දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවේ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,460,953 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,117,239 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 4,753 | 4,910 | 5,304 | 3,170 | 4,752 | 4,154 | 2,781 | 3,564 |
| (ii) | කුලී | 6,415 | 5,427 | 5,624 | 918 | 8,360 | 3,168 | 2,389 | 1,115 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,092 | 604 | 604 | - | 1,090 | 512 | 512 | - |
| (iv) | වෙනත් ආදායම් | 20,500 | 20,500 | 17,930 | 21,200 | 27,500 | 27 ,500 | 1,693 | 26,405 |
| | එකතුව | 32,760 | 31,441 | 29,462 | 25,288 | 41,702 | 35,334 | 7,375 | 31,084 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| (i) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වරිපනම් ඒකක 1083 කින් සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.3,564,335 ක හිඟයෙන් රු.2,108,130 ක මුදලක්ද, වර්ෂයේ බිල්කිරීම් රු.4,756,528 ක මුදලින් රු.1,061,758 ක මුදලක්ද අයකර නොතිබුණි. | හිඟ ආදායම් එකතු කිරීමේ ජංගම වැඩසටහනක් හා දේපළ තහනම් කිරීමේ ජංගම වැඩසටහන් ක්‍රියාත්මක වීම මගින් ඉතිරි වරිපනම් ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන කරන බව. | හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | වරිපනම් ඒකක 269 කින් වර්ෂ 05 ඉක්මවා අයවිය යුතු හිඟ මුදල රු.939,169ක් අයකර නොතිබුණි. | වරිපනම් ඒකක 269කින් වර්ෂ 05 ඉක්මවා අයවිය යුතු හිඟ ශේෂය මේ වනවිට රු.91,550 මුදලක් අයකර ගැනීමට හැකි වී ඇති බවත්, ඉතිරි හිඟ මුදල දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් කඩිනමින් අයකර ගන්නා බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **අක්කර බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.206,847 ක අක්කර බදු මුදලක් අයකර නොතිබූ අතර, අවුරුදු 05 ට වඩා කාලයක සිට අයවිය යුතු රු.153,438 ක හිඟ ශේෂයක් එම ශේෂය තුළ ඇතුළත්ව තිබුණි. | හිඟ මුදල් සමීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **කුලී** | | |
| | සභාවෙහි ලියාපදිංචි ත්‍රීරෝද රථ 366 කින් 2022 වර්ෂය සඳහා අයවිය යුතු රු.256,200 ක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | මේ වන විට ත්‍රීරෝද රථ 102 ක් බලපත්‍ර ලබාගෙන ඇති අතර ඉතිරි ත්‍රීරෝද රථ සඳහා ද කඩිනමින් බලපත්‍ර ලබාදීමට කටයුතු කරමි. | සභාවේ ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අයවැයගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ රු. 6,600,000 ක අයවැය ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත 22 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි. | රු.6,600,000 ක අයවැය ප්‍රතිපාදන සලසා තිබෙන කර්මාන්ත 22 කට අදාළ ගරු මන්ත්‍රී මණ්ඩලය හා මහජනතාවගේ ඉල්ලීම මත මහා සභා හා කමිටු තීරණ ගැනීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘති සංශෝධනය කර වෙනත් ව්‍යාපෘති සිදුකර බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කර ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය. |

## 3.2 අත්හැර දැමූ ව්‍යාපෘතීන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ග්‍රාමීය හා යටිතල පහසුකම් වැඩසටහන යටතේ කව්සිගමුව මධ්‍ය මහා විද්‍යාලයීය ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා රු.4,888,346 ක මුදලකට 2021 දෙසැම්බර් 31 දින ගිවිසුම්ගතව රු.619,480 ක පමණ වැඩ කොටසක් පමණක් නිමකර මේ වන විට එම ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. | 2023/04/20 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශ ප්‍රතිපාදන යොදවා අතරමග වැඩ නවතා ඇති ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර 2023/04/21 දිනැතිව අමාත්‍යාංශ ප්‍රතිපාදන ලබා ගැනීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ද ඇතුළත් කරමින් තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්, අවශ්‍ය ප්‍රතිපාදන ලද වහාම මෙහි ඉතිරි වැඩ කටයුතු නිම කරන බව. | කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධව, ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෙළඹුගල්ල මස් කඩ 03 ක් සඳහා හිඟ මුදල් අයකර ගැනීමට උසාවි නියෝගයක් මත රු.221,318 ක හිඟ මුදලක් හා නඩු ගාස්තු ලෙස රු.174,000 ක මුදලක් වියදම් දරා ඇති බැවින් එම මුදල් විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරන ලද නඩුවේ නඩු තීන්දු ප්‍රකාරව අදාල හිඟ මුදල හා නඩු ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් බදුකරුවන් කැඳවා සාකච්ඡා කළ අතර එහිදී ඔවුන් වාරික වශයෙන් එම මුදල ගෙවීමට ලිඛිතව එකඟතාවය ප්‍රකාශ කර ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කරඳගොල්ල අමුණ දක්වා මාර්ගය බෝක්කු දමා සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය 2020 සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වුවද එය අසාර්ථකව නිම කිරීම හේතුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. එම ප්‍රතික්ෂේප ව්‍යාපෘතිය සඳහා රු.1,322,046 ක් ණයහිමි හා ණයගැති ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණි. | ගරු මහා මාර්ග අමාත්‍යතුමා හා දිස්ත්‍රික් ලේකම්තුමා සහ පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ලිඛිත උපදෙස් ලබාගැනීම සඳහා 2021/10/08 දින ලිඛිත දැනුවත් කිරීම සිදුකළද මෙ වනතෙක් ඊට අදාල පිළිතුරු ලැබී නොමැති බැවින් මුදල් ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ කමිටුවට යොමුකළ ණයහිමි ලේඛනයේ ඉවත් කිරීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතින විට එම ව්‍යාපෘතිය සඳහා සභාවේ වගකිව යුතු නිලධාරීන්ගේ අධීක්ෂණයක් යටතේ සිදුවිය යුතුය. |